UNIVERSITY OF CAMBRIDGE INTERNATIONAL EXAMINATIONS
General Certificate of Education Ordinary Level

**SINHALA** **3205/02**

Paper 2 Translation and Reading Comprehension

May/June 2006

**1 hour 30 minutes**

Additional Materials: Answer Booklet/Paper

**READ THESE INSTRUCTIONS FIRST**

If you have been given an Answer Booklet, follow the instructions on the front cover of the Booklet.
Write your Centre number, candidate number and name on all the work you hand in.
Write in dark blue or black pen.
Do not use staples, paper clips, highlighters, glue or correction fluid.

Answer **all** questions.
At the end of the examination, fasten all your work securely together.
The number of marks is given in brackets [ ] at the end of each question or part question.

This document consists of **4** printed pages and **4** blank pages.

SP (CW/CW) T14509/1
© UCLES 2006

UNIVERSITY of CAMBRIDGE International Examinations

**[Turn over**

**BLANK PAGE**

## Section A: Translation

**1** Translate into **English**:

මහල්ලා වීදිය දිගේ හෙමින් ඇවිදගෙන ගොස් පාර හරහා යන තැන නතර විය. හැරමිටියට හේත්තු වූ ඔහු පාර දෙපැත්ත බැලුවේය. පාර සෑහෙන තරම් නිහඬව තිබූ අතර මොටෝරිය ස්වල්පයක් පමණක් ඔහු පසුකර ගියේය. ප්‍රවේසමෙන් එක් පයක් ඔසවා පාරට තැබීමට පෙර ඔහු තරමක් වේලා බලා සිටියේය. එවිට එක්වරම මොටෝරියක් වංගුවෙන් මතු වී ආවේය. මහල්ලා ගැන කිසිදු සැලකිල්ලක් නොදැක් වූ රියැදුරා මාරුවෙන ස්ථානය හරහා වේගයෙන් ගියේය. වහාම පස්සට ගිය මහල්ලා කම්පා වූ බවක් පෙනුණි. ඔහු සිය හිස සෙලවීය. පාරේ අනිත් පැත්තේ සිටි තරුණයෙක් සිදු වූ දෙය දුටුවේය. ඔහු පාරෙන් එහා පැත්තට ගොස් මහල්ලාගේ අතකින් අල්ලා ගත්තේය. එක් අතකින් තමන් දෙසට එන වාහනවලට අනතුරු අඟවමින් ඔහු කාරුණික ලෙස මහල්ලා පාරෙන් අනිත් පැත්තට කැටුව ගියේය.

[10]

**2** Translate into **Sinhala**:

The young man began the day in a hurry and in a bad mood. He knew he was going to have to rush today to get his assignment handed in on time. He had worked halfway through the night to get it finished. He had gone to bed thinking it was in his notebook inside his bag, but the next morning it wasn't there. He spent a frantic hour looking for it, but still could not find it.

"Have you checked inside your notebooks and in your college bag?" his mother asked.

"Of course I have!" he replied angrily.

"Well, I will just check them anyway," she said, disappearing out of the room.

"That won't do any good," he replied, now pulling the contents of his cupboard onto the floor. He stamped his foot in annoyance and yelled as he stepped on a stapler. His mother walked back into the room.

"I've looked absolutely everywhere," he mumbled.

"Not quite everywhere," she replied quietly, waving the assignment in her hand. "This was in the side pocket of your bag."

[20]

## Section B: Reading Comprehension

Read the following passage carefully and then answer in **Sinhala** the questions that follow.

### ශ්‍රී ලංකාවේ දිවියෝ

අපේ කණ්ඩායම තුළ වූයේ ඉමහත් උද්යෝගිමත් භාවයකි. උදෑසනම අවදිවෙන්න සිදුවීම නිසා ඇතිව තිබූ අසතුටුදායක තත්වය මගහැරි ගොස් බොහෝ වේලාවකි. අන් සියල්ලටම වඩා වැදගත් වූයේ අපේ ගමනේ ප්‍රධාන අරමුණ යාල වනයේ මහාගල්කුළක් මත දිගා වී ඉරු රැස් නාමින් සිටිනු දක්නට ලැබීමය. භයානක, නමුත් සුන්දර දිවියා ලංකවේ වනාන්තරවල ආඩම්බරයයි. සමහරවිට අලියා හැර අන් සියල්ලෝ ඔවුන්ට බියවෙති. සතුන් ගොදුරු කරගන්නා සතුන් අතර ප්‍රධාන වූ ඔව්හු වනාන්තරවල සිටින ශාක භක්ෂක සත්ව සංඛ්‍යාව පාලනය කිරීමේ වැදගත් කාර්යය ඉටු කරති.

ආචාර්ය රවි සමරසිංහ අප කණ්ඩායමේ නායකයායි. චාමි, ළා පාට ඇඳුමින් සැරසී සිටින ඔහුගේ කථා විලාසය මෘදුය. එහෙත් පිටත පෙනුම නොමග යවන සුලු විය හැකියි. අවුරුදු දහයකට ආසන්න කාලයක් තිස්සේ ඔහු, ලොව සිටින අතිශයින් භයානක සතකු පසුපස යමින් සිට ඇත.

ඔහු මුලින්ම දිවියන් ගැන උනන්දුවන්නට පටන් ගත්තේ කෙසේද? "වනයට ගොස් දිවියන්ගේ පිංතුර ගන්නට පටන්ගන්නට පෙර මා වැඩිපුර උනන්දුවක් දැක්වූයේ කුරුල්ලන් ගැනයි." රවි අතීතය සිහිකරයි. ඉන්පසු ඔහු දිවියන් දුටු අවස්ථා පිළිබඳ තොරතුරු සටහන් කිරිම සඳහා වාර්තා පොතක් තබා ගැනිමට පටන් ගත් අතර එහි මෙබඳු ප්‍රශ්න ද සටහන් කළේය: "මට ඔවුන් සමහර වෙලාවට පෙනෙන්නේත් සමහර වෙලාවට නොපෙනෙන්නේත් ඇයි? මට බොහෝ අවස්ථාවල දක්නට ලැබෙන්නේ එකම දිවියාද? නැත්නම් වෙනස් උන්ද?" ඔහුගේ උනන්දුව පිළිබඳ හොඳම නිදසුනකි ඔහුගේ සටහන් පොත. එය දිවියන්ගේ ලස්සණ රූ සටහන්වලින් මෙන්ම විසිතුරු වූ ඒ ඒ දිවියාට විශේෂ වූ " පුල්ලි රටාවන්" පිළිබඳ චිත්‍රවලින් සැරසි ඇත්තකි.

ලොව වෙනත් ප්‍රදේශවලට වඩා මෙහි දිවියන් විශාල සංඛ්‍යාවක් දක්නට ලැබේ. ඒ අතර රෝගී සත්තු ද කීප දෙනෙක් වෙති. " එක ඇසක් නැති ගෑනු සතාගේ තත්වය සලකා බලන්න. ඇ වුණත් හොඳට කා බී සනීපෙන් ඉන්න බව පෙනෙනවා. ඒකෙන් පැහැදිලි වන්නේ මෙහේ ඒ අයට ඕනතරම් ගොදුරු තියෙන බව. ඒත් අපි ටිකක් පරිස්සම් වෙන්න ඕන. මිනිස්සු තම ගම්මාන මේ සතුන්ගේ වාසභුමි තුළට ව්‍යාප්ත කරන නිසා ඉක්මණින්ම බරපතළ ප්‍රශ්නයක් මතුවෙන්න පුලුවන්." රවී මට කරුණු පැහැදිලි කරයි.

මේ අතර සම්, දත් හා ඇට ලබා ගැනීම සඳහා දිවියෝ තවමත් දඩයම් කරනු ලබති. 1938 සිටම දිවියා ආරක්ෂිත සතකු වුව ද හොරෙන් සතුන් දඩයම් කිරීමේ අඩුවක් දක්නට නොලැබීම ලොකුම තර්ජනය වී ඇත. ආසියානු දිවියා වඳවී යාමේ තර්ජනයට මුහුණ පා සිටින සතකු වුවත් සතුන්ගෙන් ලබාගන්නා දේ විකිණීමේ හොර ජාවාරම තවමත් කෙරීගෙන යයි.

© UCLES 2006

"යාල දී දිවියන් දැකගැනිමට උපදෙසක් හෙම?" අප වනය තුළ ගෙවූ වෙහෙසකර දවස අවසානයේ මම රවීගෙන් ඇසුවෙමි. "සාමාන්‍යයෙන් දිවියා දකින්න පුලුවන් උදේ පාන්දරින්ම හරි හොඳටම හැන්දෑවෙලා. හොඳට හැංගී නිශ්ශබ්දව ඉන්න හිතාගන්න ඕනෑ. දිවියා දකින්ට ලැබුණ හැටියේ පළමු විනාඩි කීපය හරිම වැදගත්. ඒ කාලය තුළ හිතාගන්න පුලුවන් ඌ එතනම ඉඳියි ද නැත්නම් එතැනින් පළායයිද කියන එක. ඒ නිසා හදිසියේ දිවියකු ඇස ගැසුණොත් ඒ පැත්තටම යාර කීපයක් යන එක වැදගත්. ඊළඟට නිහඬව ආපසු හැරී එන්න. නරකම දේ තමයි දුටු වහාම නතර වීම. එය දිවියා තේරුම් ගන්නේ තර්ජනයක් හැටියට. මේ නිසා පහර දීමට සැරසීම හෝ වහා පළායාමක් සිදුවිය හැකියි. ඔබ සංවර වූ තරමට හොඳයි. හැකිතරම් සංසුන් වන්න." රවී තවදුරටත් කියයි.

Now answer the following questions in **Sinhala** using your own words as much as possible.

**1** **මේ ලෙඛකයා ද සාමාජිකයකු වූ කණ්ඩායම තුළ තම අත්දැකීම පිළිබඳව ඇති වූ හැඟීම් විස්තර කරන්න.** [2]

**2** **කණ්ඩායමට එතරම් උදැසතින් අවදිවීමට සිදුවූයේ ඇයි?** [1]

**3** ඒ තරම් උදෙන් අවදිවීමට සිදුවීම ගැන ලේඛකයා එතරම් සතුටු නොවූ බව අප දැනගන්නේ කෙසේද? [1]

**4** **ලංකාවේ ස්වාභාවික පරිසරයේ සමබරබව රැක ගැනිම සඳහා දිවියා උපකාරී වන්නේ කෙසේද?** [1]

**5** **රවිගේ බාහිර පෙනුම නොමග යවන සුලු යයි ලෙඛකයා කියන්නේ මන්දැයි ඔබේ වචනවලින් විස්තරකරන්න.** [3]

**6** **ආචාර්ය රවී හැමවිටම දිවියන් ගැන උනන්දු වූවෙක් ද? ඔබේ පිළිතුරට හේතුවක් සඳහන් කරන්න.** [2]

**7** **මේ පාඨයට අනුව රවී සටහන් පොතක් පවත්වාගෙන යාමේ ප්‍රයෝජනය කුමක් ද? ප්‍රයෝජන තුනක් සඳහන් කරන්න.** [3]

**8** **රවී එක් දිවියෙකු තවත් දිවියෙකුගෙන් වෙන්කොට හඳුනාගන්නේ කෙසේද?** [1]

**9** **මේ පාඨයේ සඳහන්වන රෝගීදිවියාගේ ආබාධය කුමක් ද?** [1]

**10** **රෝගී දිවියන් කීපදෙනෙකුට වුව ද නොමැරී ජීවත් වීමට උපකාරි වන ඔවුන්ගේ ස්වාභාවික පරිසරයේ පවතින සාධකය කුමක් ද?** [2]

**11** **මිනිසා ප්‍රවේසම් විය යුත්තේ කෙසේ ද?** [1]

**12** **ලංකාවේ දිවියන්ගේ පැවැත්මට එල්ල වී ඇති ලොකුම තර්ජනයත් එසේ වීමට හේතුවත් නම් කරන්න.** [2]

**13** **මේ පාඨයේ දැක්වෙන පරිදි, වනයේ දි දිවියන් දැකීම සඳහා අනුගමනය කළයුතු හොඳම ක්‍රමය විස්තර කරන්න.** [5]

BLANK PAGE

BLANK PAGE

**BLANK PAGE**

Permission to reproduce items where third-party owned material protected by copyright is included has been sought and cleared where possible. Every reasonable effort has been made by the publisher (UCLES) to trace copyright holders, but if any items requiring clearance have unwittingly been included, the publisher will be pleased to make amends at the earliest possible opportunity.

University of Cambridge International Examinations is part of the University of Cambridge Local Examinations Syndicate (UCLES), which is itself a department of the University of Cambridge.